**ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 14දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍යප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍යප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍යප්‍රකාශනවලව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍යප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍යප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍යප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල 2013 වර්ෂයේදී ඉදිකරන ලද වෙළඳ කුටි 12 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණ අතර, රු. 3,712,800 ක සූර්යබල විදුලි පද්ධතිය මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියලුම වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ රු.250,000,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුවරු.750,000,000 ක් ලෙස සංශෝධනය කර තිබීම හේතුවෙන්, මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 200 ක විචලනයක් පැවැතුණි. | 2023 වර්ෂයේ ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන් හා 2022 වර්ෂයේ දෙවන කාර්තුව දක්වාවූ ආදායම මත පදනම්ව ඇස්තමේන්තු කළ බැවින් විචලනයක් ඇති වූ බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට තාත්විකව හා නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ තේ වත්ත බදු දීමෙන් ලැබිය යුතු රු. 627,000 ක බදු කුලී ආදායම, රාජකීය උද්භිද උද්‍යාන කැෆටේරියා ආපනශාලාවේ බදු කුලී ආදායම හා එම ආපනශාලාව සඳහා අයවිය යුතු ජල හා විදුලි බිල්පත් රු.2,794,664 ක් වශයෙන් එකතුව රු.3,421,664 ක හිඟ ආදායමක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් හෙවත් රු.59,408,225 ක මුදලක් ඉතිරිව පැවතියද, වර්ෂය තුළදී පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.4,000,000 ක අතිරේක ප්‍රාග්ධන ප්‍රතිපාදන සම්පාදනය කර ගැනීමට කටයුතු කර තිබුණි. | මූලධන ප්‍රතිපාදන සියල්ල උපයෝජනය කිරීමට සැලසුම් කර තිබූ බැවින් වාහන 02 ක් අළුත්වැඩියාව සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගත් බව. | සැළසුම් සහගතව වියදම් කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරකම් 07 ක් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයම එනම් රු. 20,100,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී පැවතුණි. | ප්‍රසම්පාදනයේදී ඇති වූ ප්‍රමාදයන් හා කාලගුණික හේතු මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාස 02 ක තුළදී සිදුකර තිබූ ගෙවීම් සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේදී අවස්ථා 17 කදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන්ගෙවා තිබුණු රු.1,374,068 ක වියදම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ වියදම පසුව හඳුනා ගැනීම හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත 2024 වර්ෂයේ ගෙවා ඇති බව. | වර්ෂයට අදාල බැරකම් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කල යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | **1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය** | - | උද්‍යාන 05 කට අයත් හෙක්ටයාර් 362.3744 ක වපසරිකින් යුතු ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අවසන් කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙන් පවරා ගත යුතු මෙම ඉඩම් විධිමත් පරිදි පවරා දී නොමැති බව. | ඉඩම් කඩිනමින් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | XXIV පරිච්ඡේදයේ 4, හා 6.3 වගන්ති | 4,343,939 | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විශ්‍රාම ගොස් ඇති, මියගිය හා සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 35 දෙනෙකුගේ ණය ශේෂයන් අය කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (3) රෙගුලාසිය** | 3,396,098 | කාලය ඉකුත් වූ තැන්පතු 55 ක් නිරවුල් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | **1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය** | 10,519,457 | පර්යේෂණ ව්‍යාපෘති 03 ක් සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලබා දී තිබුණු විදේශ අරමුදල් මහා භාණ්ඩාගාර විදේශාධාර ප්‍රදාන අරමුදල් ගිණුමට බැර නොකර සෘජුවම දෙපාර්තමේන්තු ගිණුම් වෙත ප්‍රේෂණය කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු වනෝද්‍යානයේ ඒකදේශීය පැල නඩත්තු කිරීම හා සංවර්ධනය, වනෝද්‍යාන පැල ගෘහය නඩත්තු කිරිම සහ සංවර්ධනය, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, කාර්ය මණ්ඩලය සඳහා වැඩ මුළු පැවැත්වීම, නරඹන්නන් සඳහා මඟ පෙන්වීම, නරඹන්නන් සඳහා වැඩ මුළු පැවැත්වීම හා ප්‍රකාශන එළි දැක්වීම යනාදී ක්‍රියාකාරකම් 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, වනෝද්‍යාන තවානේ පැල ලේබල් කිරීම, වනෝද්‍යානයේ විදේශීය පැල නඩත්තු කිරීම හා සංවර්ධනය, වනෝද්‍යානයේ දේශීය පැල නඩත්තු කිරීම හා සංවර්ධනය හා බාහිර පාර්ශවයන් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම යනාදී ක්‍රියාකාරකම් 04 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 58 දක්වා පරාසයක පැවතුණි. | නිලධාරීන්ගේ හිඟය, කාලගුණික තත්ත්වයන්, මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සීමිත පුහුණු වැඩ සටහන් පමණක් ක්‍රියාත්මක කළ බව. | ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය අත්පත් කර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

### 3.2. විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විනාශවීමට ලක් වෙමින් පවතින ශ්‍රී ලකාවට ආවේනිකශාක සංරක්ෂණය සඳහාඋද්භිද උද්‍යාන සංරක්ෂණ ජාත්‍යන්තර ආයතනය මගින්2022නොවැම්බර් 09 වන දින රු.1,776,688 ක් දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කර තිබුණද, ඉන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,696,270 ක් එනම් සියයට 95 ක් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | මෙම ප්‍රතිපාදන භාවිතා කරමින් 2024 වර්ෂය තුල අවසන් කිරීමට අපේක්ෂා කරන බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ඇ) හා 8.9.1 (ආ) උප වගන්තිවලට අනුව තාක්ෂණ අංශයේ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව හා ගිවිසුම්ගත වීමකින් තොරව හක්ගල උද්භිද උද්‍යානයට ඇතුල්වීමේ හා උද්‍යානයෙන් පිටවීමේ දොරටු ආසන්නයේ LED පුවරු 02 ක් සවිකිරීම සඳහා ප්‍රසම්පාදනය කර රු.6,481,080 ක් සැපයුම්කරුවෙකුට ගෙවා තිබුණි. එසේ සවිකළ LED පුවරු 02 සවිකළ දිනයේ සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | අදාළ ආයතනය සමග සම්බන්ධ වී ඉදිරියේදී යථාවත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී අදාල නීති රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩාවක් තුල වර්ෂ 01 සිට වර්ෂ 05 ක් අතර කාලයක සිටඑකතුව රු.7,916,374 ක යන්ත්‍ර හා උපකරණ 54 ක් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතිණි. ඒ තුල මිලදී ගත් දින සිට භාවිතයට ගෙන නොමැති රු.3,572,815 ක යන්ත්‍ර හා උපකරණ 03 ක් පැවතුණි. | ඉදිරියේදී භාවිතා කිරීමට කටයුතු කරන බව. | යන්ත්‍ර හා උපකරණ ඵලදායිව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | උදභිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් උද්‍යාන 04 ක් සඳහා මිලදී ගෙන තිබුණු රු. 23,610,780 ක ගොල්ෆ් කාර් රථ 10 ක් මාස 02 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට අළුත්වැඩියා කර භාවිතයට ගැනීමකින් තොරව විනාශවීමට ඉඩ හැර තිබුණි. මේ හේතුවෙන් එම වාහන භාවිතා කර උපයා ගැනීමට හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදී අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | ගොල්ෆ් කාර් රථ කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. . |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ 2013 වර්ෂයේ ඉදිකර තිබුණුවටිනාකම හඳුනාගත නොහැකි වූ වෙළඳ කුටි 09 ක් වර්ෂ 10 ක කාලයක සිට නිශ්කාර්යයව පැවතුණි. | 2024/ 2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය මිල ගණන් කැඳවා බදු දීමට අවශය පියවර ගන්නා බව. | ගොඩනැඟිලි ඵලදායිව උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය බැටරි කාර් රථ 10ක් සඳහා රියදුරන් 05 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබීම හේතුවෙන් නිරන්තරව බැටරි කාර් 05 ක් නිශ්කාර්යව පැවතුණි. | නරඹන්නන්ගේ අවශ්‍යතාවය අනුව සැපයීම වෙනුවෙන් විවිධ ප්‍රමාණයේ බැටරි කාර් පවතින බව හා බැටරි කාර් 02 ක් හක්ගල උද්භිද උද්‍යානයට යැවීමට සැලසුම් කර ඇති බව. | නිශ්කාර්යය බැටරි කාර් රථ ඵලදායිව උපයෝජනය කර ගැනීම කෙරෙහි කටයුතු කළ යුතුය. |
| (ඉ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 0.5015 ක ඉඩමක් හා හක්ගල උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 49.564 ක ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විදින නමුත්, මෙම ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම් නිරවුල් කර කඩිනමින් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හක්ගල උද්භිද උද්‍යානයේ සංචාරක බංගලාවේ කාමර 04 ක කුඹුක් ලෑලි ඇතිරීම වෙනුවෙන් Provisional sum වශයෙන් ඇස්තමේන්තු කර ගෙවා තිබූ රු.900,000 ක මුදල තුල වටිනාකම රු.145,125 ක මුදලක් සාවද්‍ය ලෙස දක්වා 2022 අගෝස්තු 12 දින වැඩිපුර ගෙවා තිබුණි. මේ සම්බන්ධව මුදල් රෙගුලාසි104(3) හා 104(4) ප්‍රකාරව පරීක්ෂණ සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රු.3,344,731 ක් වැය කර ඉදිකළ ළමා අධ්‍යාපනික ඒකකයට අදාළ කොන්ත්‍රාත්තුවේ ගෙවීම් බිල්පත අනුව ක්‍රීඩා ප්‍රදේශයේ 1:3 | අදහස් දක්වා නොමැත. | ඉටු නොකළ කාර්යයන් සඳහා ගෙවීම් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුපාතයට කපරාරු කිරීම හා අන්තර් සම්බන්ධිත ගල් ඇතිරීම යන වැඩ විෂයයන් 02 ක ඇතුළත් කාර්යයන්ඉටු කර නොතිබියදී, ඉටු කළ බවට නිර්දේශ කර රු.174,627 ක් ගෙවා තිබුණි. | | |
| (ඇ) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ජලඅවශ්‍යතාවය සඳහා ෆෙරෝ සිමෙන්ති ටැංකියක් ඉදිකිරීම සඳහා රු.5,609,030 කට 2021 අගෝස්තු 19 දින ගිවිසුම්ගතවකොන්ත්‍රාත් ආයතනයකට ඉදිකිරීම පවරා තිබුණි. 2021 නොවැම්බර් 15 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද, යථෝක්ත කොන්ත්‍රාත්තුව සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන තෙක් එහි වැඩ අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබියදී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අවස්ථා 05 කදී එකතුව රු.5,855,645 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම් බිල්පත්වල සඳහන් 27 හා 29 සිට 41 දක්වා වැඩ විෂයන් ඉටු කර නොතිබියදී ඉටු කළ බවට බිල්පත් සාවද්‍ය ලෙස සකස් කර, නිර්දේශ කර ඒ සඳහා රු.2,145,422 ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉටු කළ කාර්යයන්ට පමණක් ගෙවීම් සිදු කළ යුතුය. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ සිදු වූ හානි හා පාඩු සිද්ධි 05ක්සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර අලාභ හා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 (4) පරීක්ෂණ කඩිනමින් නිම කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ නියමිත කාලය තුල සිදු කළ යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හක්ගල උද්භිද උද්‍යානයේ 2021 දෙසැම්බර් මස රු. 904,909 ක වියදමින් ඉදිකර තිබූ පැති බැම්මක් විධිමත් සැලැස්මක් හා ප්‍රමාණවත් අධීක්ෂණයකින් තොරව ඉදිකිරීම හේතුවෙන් 2023 අප්‍රේල් මස පෙරළී ගොස් තිබුණි. | ස්වාභාවික විපතක් නිසා සිදු වී ඇති බව. | හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමකින් තොරව රාජකීය උද්භිද උද්‍යානයේ වසර 200 සැමරුම සඳහා ඉකුත් වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු.3,096,360 ක සමරු පළඟනා 4000 ක් හා රු.3,081,000 කට“200 වස් සැමරුම” නමින් වූ පොත් 1000 ක් මිලදි ගෙන ඒ අතුරින් රු.3,534,930 ක පොත් 930 ක් හා රු.2,537,474 ක සමරු පළඟනා 3273 ක් වසරකට අධික කාලයක් අලෙවි කර ගත නොහැකිව පැවතුණි. | 2022 වර්ෂයේ රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් 200 වස් සැමරුම් උත්සවය අපේක්ෂිත මට්ටමින් පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් මෙම භාණ්ඩ නිෂ්කාර්යයව පවතින බව. | අවශ්‍යතාවය පිළිබද නිවැරදි ඇගයීමකින් පසු මිලදී ගැනීම කළ යුතුය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 නොවැම්බර් 10 දිනැති අංක 1471-2006 දරන සාමාන්‍ය ගැසට් පත්‍රය මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති උද්භිද උද්‍යාන නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ප්‍රකාශයට පත් කර වසර 17 ක කාලයක් ඉක්ම ගොස් ඇතත්, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ස්ථාපිත කර තිබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්මඅධ්‍යක්ෂ ජනරාල් නිල නිවාසය හා කෘෂි ප්‍රකාශන ඒකකය උද්භිද උද්‍යානය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම මැනුම් කර අයිතිය කඩිනමින් පවරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජකීය උද්භිද උද්‍යානයේ කැෆෙටේරියා ආපනශාලාව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට බදු පදනම මත ලබා දී තිබූ පෞද්ගලික ආයතනය විසින් ගෙවිය යුතු රු.2,027,165 ක හිඟ බදු කුලී අයකර ගැනීමකින් තොරවඑම ආයතනය වෙත2022 වර්ෂය සඳහාද මාසිකව රු.287,000 ක මුදලකට නැවත ආපනශාලාව බදු පදනම මත ලබා දී තිබුණි. | පිළිගනිමි. කාර්යාල කටයුතුවල සිදු වූ අඩුපාඩු හේතුවෙන් හිඟ මුදල අයකර ගැනීමට නොහැකි වූ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොවිඩ් වසංගතය පැවති කාලය තුල,එනම් 2020 අප්‍රේල් සිට මාස 18 ක කාලය තුල කැෆෙටේරියා ආපනශාලාව භාවිතා කිරීමෙන් ජලය හා විදුලිය පිළිවෙලින් රු.130,608 ක් හා රු.744,410 ක් ගෙවීමට තිබියදී, එම කාලය තුල ආපනශාලාවේ මාසික බදු කුලී රු.9,023,652 ක් කොන්ත්‍රාත්කරුගෙන් අය නොකිරීමට තීරණය කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | රජයේ ආදායම් කපා හැරීමේදී නිවැරදි ක්‍රමවේදය අනුව සිදු කළ යුතුය. |

**4 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව තිරසර සංවර්ධන අරමුණු (SDG) 04 ට අදාලව පිහිටුවා ඇති දර්ශක 04 ක ප්‍රගතිය සියයට 50 සිට සියයට 66 දක්වා පරාසයක විය. | නිලධාරීන්ගේ හිඟය, පුහුණු පාඨමාලා සඳහා ඉල්ලුම අඩුවීම හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 906 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 750 කි. ඒ තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11 ක් ද ඇතුළුව පුරප්පාඩු 166 ක් පැවති අතර, අතිරික්ත නිලධාරීන් 10 ක් විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් සඳහා බඳවා ගෙන ඇති බව හා අනෙකුත් බඳවා ගැනීම් සඳහා ඉල්ලීම් කර ඇති බව. | අවශ්‍යතාවය හඳුනාගෙන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |